# දිරිය දියණියෝ



කේ.ජී.ඩී.දිනායා බණ්ඩාර.

# දිරිය දියණියෝ

කේ.ජී.ඩී.දිනාායා බණ්ඩාර.

**ISBN - 978-624-208-062-8**

කෘතිය පළ කරන දිනය - 25.11.2023

කතෘගේ වෙනත් කෘති -

පුංචි ඉබි සමගිය.
The Monkey's Shop.
අපූරු කැලෑ යාලුවෝ.
Sweet Little Bunnies.
My Little Nursery Rhymes and Poem.
කළු පූසිගෙයි සුදු පූසිගෙයි කැවුම් කෑම.

පිදුම

මෙම පොත මාගේ
ආදරණීය අම්මාට,
අප්පච්චිට සහ
අත්තම්මාට, ගෞරවනීය
විදුහල්පතිතුමියට,
6-F පන්තිභාර
ගුරුතුමියට,
විදුහල්මාතාවට,
"දිරිය දියණියෝ"
සෙනෙහසින් පිළිගන්වමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# දිරිය දියණියෝ

එකෝමත් එක කාලෙක ලස්සන ගමක පුංචි පවුලක් ජීවත් වුණා

මේ පවුලේ අම්මයයි, තාත්තයි, දුවලා තුන්දෙනයි, පුත්තු දෙදෙනෙකුයි සිටියා.

මේ පවුලේ සෑම දෙනා ම සතුටින් තමයි කාලය ගත කළේ.

දුවලා තුන්දෙනාට ලොකු වෙනකම් ම ඉගැන්නුවේ අම්මයි, තාත්තයි. ඉතින් ඔහොම ටික දවසක් ගෙවිලා ගියා.

එක දවසක් අම්මයි, තාත්තයි දුවලා තුන්දෙනාට මෙහාට එන්න කියලා කතා කළා.

දියණියෝ තිදෙනා හරි ම කීකරුයි . ඒ නිසා අම්මයි තාත්තයි ළඟට ඉක්මනට ආවා.

දුවලා දැන් ගොඩක් ලොකුයිනේ, අම්මයි තාත්තයි දැන් වයසයි.  ඒ නිසා අම්මටයි තාත්තටයි මහන්සි වෙලා වැඩ කරන්න බැහැ.

මල්ලිලා තාම ලොකු නැහැ. එයාලා තාම පාසල් යන වයසේ දරුවෝ.



අපි මල්ලිලා දෙන්නාට හොඳට උගන්වන්න ඕන.

අපිට දැන් වයස නිසා දුවලා මහන්සි වෙලා වැඩ කරලා සල්ලි උපයාගන්න ඕනෑ.

අපි දැන් ඔයාලට වැඩක් කියනවා.

ඒක කම්මැලි නැතුව අපි කියන විදිහට කරන්න. ඒ වැඩේ හරි ගියොත් අපිට දිගටම කරගෙන යන්න පුළුවන්.

හොඳ දුවලා වගේ කූඩ තුනක් අතට අරගෙන මල් වත්තට ගිහිල්ලා විසිතුරු වර්ගයේ මල් ටිකක් කඩාගෙන එන්නකෝ.

ටික වෙලාවකට පසු දියණියෝ තිදෙනා ආපසු පැමිණියෝ ය. අම්මේ, තාත්තේ අපි කූඩ පිරෙන්න මල් කඩාගෙන ආවා.

ඉන්පසු කරන්නේ කුමක් ද? දැන් දුවලා කරන්න ඕනේ මේ මල් ටික පිළිවෙලකට පෙට්ටියකට අඩුක් කරන එක.

ඊට පස්සේ මල් ටික මල් වෙළඳසැලකට විකුණලා මුදල් රැගෙන එන්න. හරි හරි අපි ඒක කරන්නම්.

දුවලා තිදෙනා මල් ටික වර්ග කරලා පෙට්ටිවලට වෙන වෙන ම පිළිවෙළකට අඩුක් කළා. අපි දැන් මේ මල් මලීනා යාළුවාගේ නිවස  අසල තිබෙන මල් වෙළඳසැලට විකුණමු, කියලා ලැවීනා දුව  කිව්වා.



අනිත් දූලා දෙදෙනාද දෙමාපියන්ද එයට කැමති වුණා. ඊට පස්සේ මල් ටිකට වතුර ඉස්සා.

මල් ටිකට වතුර ඉස්සට පස්සේ මලීනා යාළුවාගේ නිවස අසල තිබෙන මල් කඩයට ගිහින් මල් ටික විකුණුවා.

මල් කඩේ මුදලාලි මල් වෙනුවට, මේ ළමයි තිදෙනාට සල්ලි දුන්නා.

දුවලා තුන්දෙනා හරිම සතුටින් මුදලුත් රැගෙන තම නිවසට ආවා. නිවසට ඇවිත් අම්මගෙයි තාත්තගෙයි අතට සල්ලි ටික දුන්නා.

අම්මටයි තාත්තටයි හරිම සතුටුයි. ඉතින් අම්මයි තාත්තයි දුවලා තුන්දෙනාව අගය කළා.

දුවලා තුන්දෙනා මේ විදිහට හැමදාම වගේ මල් කඩාගෙන ඇවිත් කඩේට විකුණලා සල්លි අරන් එනවා.

ඔහොම ටික දවසක් ගෙවිලා ගියා. දුවලා තුන්දෙනාම මේ වැඩේ කරන්නේ නම් හරිම සතුටින් තමයි. ඉතින් එක ලස්සන උදෑසනක මේ තුන්දෙනා මල් කඩන්න වත්තට ගියා. මේ අය මල් කඩ කඩ ඉද්දී මෙයාලට හිතුනා තමන්ගේ ම කියලා ඉඩමක ලස්සනට මල් වගා කරන්න.



ඉතින් මේ දියණියන් තිදෙනා මේ ගැන අම්මටයි තාත්තටයි කිව්වා. දුවේ අපි ළඟ තාම ලොකු සල්ලියක් එකතු වෙලා නැහැ. ඉඩමක් ගන්න නම් ලොකු වියදමක් යනවා. දුවලා තවත් ටිකක් මහන්සි වෙලා මල් ගොඩක් කඩලා විකුණුවොත් අපිට පුළුවන් ඒ සල්ලිත් එකතු කරලා ලොකු ඉඩමක් මිලට ගන්න.

එතකොට අපිට පුළුවන් වැඩි කලක් යන්න කලින් ලස්සන, විසිතුරු මල් වවලා අපේ ම කියලා මල් වත්තක් හදාගන්න.

අම්මයි තාත්තයි දුවලා තිදෙනාට මෙහෙම කිව්වා.

ඉතින් දුවලා තිදෙනා මහන්සි වෙලා මල් කඩලා කඩයට විකුණුවා. අන්තිමේ දී එයාලට ඉඩමක් මිලට ගන්න ඇතිවන තරමේ, මුදලක් එකතු වුණා .

දුවලා තිදෙනා  මහන්සි වෙලා සල්ලි උපයන අතර මග දී මල්ලිලා දෙදෙනාම හොඳින් ඉගෙන ගත්තා.

ඊට පස්සේ මල්ලිලා දෙන්නාත් දුවලා තුන්දෙනාත් එකතු වෙලා ලස්සන මල් වවලා, තණකොළ හිටවලා මේ ඉඩම ලස්සන මල් වත්තක් බවට පත් වුණා.

මේ දරුවන් උදෑසනම නැගිටලා මල් කඩලා කඩයට විකුණලා ඒ සල්ලිවලින් තම දෙමාපියන්ව ඉතා ආදරයෙන් රැක බලා ගත්තා.

ටික කාලයක් යද්දී මේ මල් වත්ත පළාතේ තිබෙන හොඳම මල් වත්ත බවට පත් විය.

ඒ වගේම සංචාරකයින්ට නැරඹීමට හැකි ස්ථානයක් බවට පත් විය.



වැඩි කලක් යන්නට මත්තෙන් මේ
පවුල පළාතේ පොහොසතුන් බවට
පත්විය.

දෙමාපිය අවවාද පිළිගත්
මේ දරුවන් සමගියෙන් සහ
ඉතා සතුටින් ජීවත් වුණා.

නිමි.



## පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නුතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01